# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: NPD/DCB2022
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.12.31

චක්‍රලේඛ අංක: MF/NPD 03/2021

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>විමධ්‍යගත අයවැය වැඩසටහන - 2022</u>

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ **"රට හදන සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ග්‍රාමීය සංවර්ධනය තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කරමින් රට සංවර්ධනය කිරීමට අරමුණු කර ඇති අතර ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට ද අපේක්ෂිතය.

එම දැක්ම යථාර්තයක් කිරීමේ අරමුණ ඇතිව සකස් කර ඇති වසර 2022 – 2024 මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ අයවැය - 2022 සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ දී සංවර්ධන ප්‍රතිලාභ කඩිනමින් මහජනතාව වෙත ලබාදීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කිරීමට රජය තීරණය කර ඇත. තවද, Covid 19 වසංගතය හේතුවෙන් ග්‍රාමීය ජනතාවට බලපා ඇති අහිතකර බලපෑම අවම කිරීම හා පසුගිය වර්ෂය තුල වර්ෂාව ඇතුළු ස්වභාවික ආපදා හේතුවෙන් විනාශයට පත් වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ද ප්‍රමුඛ අවශ්‍යතාවයකි.

ග්‍රාමීය සංවර්ධනයට වැඩි අවධානයක් යොමු කරමින් මෙතෙක් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙනුවෙන් වෙන් කර තිබූ රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන ප්‍රමාණය, රුපියල් මිලියන 05 කින් ඉහල නන්වමින් 2022 වර්ෂයේ දී **රුපියල් මිලියන 15 ක ප්‍රතිපාදන** වෙන් කර ඇත.

2022 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති හඳුනාගැනීමේ දී 2022 අයවැය යෝජනා මගින් ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කරගනිමින් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ඔබ වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන යොදාගෙන ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කෙරේ අවධානය යොමු කරමින් ව්‍යාපෘති යෝජනා ද්විකරණය නොවන පරිදි ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කළ යුතුය.

2022 විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් පහත පරිදි නිකුත් කෙරේ. **2022 ජනවාරි 31 වන දින ට පෙර** ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා විසින් පහත සඳහන් අංශ යටතේ හඳුනාගත් යෝජනා ඔබ වෙත ඉදිරිපත් කරනු ඇත.

**ව්‍යාපෘති තෝරාගැනීම හා ප්‍රතිපාදන වෙන් කිරීම**

**1. ව්‍යාපෘති තෝරා ගැනීම**

**1.1** ග්‍රාමීය ප්‍රජා පානීය ජල සම්පාදන ව්‍යාපෘති

**1.2** කුඩා ප්‍රමාණයේ ග්‍රාමීය විදුලි ව්‍යාපෘති/සුළු පරිමාණ විදුලිය දීර්ඝ කිරීම් (මෙම ව්‍යාපෘති 2022 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කර අවසන් කළ හැකි බවට ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහතික විය යුතුය.)

**1.3** පළාත් මාර්ග, ග්‍රාමීය මාර්ග, කෘෂි මාර්ග, අඩි පාරවල්, පියගැටපෙලවල්, පාලම්, බෝක්කු, ඒදඬු, කම්බි පාලම්, මාර්ග දෙපස කාණු පද්ධති වැනි ග්‍රාමීය ගමනාගමන පහසුකම් සම්පාදන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති.

**1.4** නිෂ්පාදනයන්ට වැඩි වටිනාකමක් /වැඩි මිලක් ලබාදෙන ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමට ඉවහල් වන කඩමණ්ඩි/සතිපොළ/අලෙවි මධ්‍යස්ථානවල භෞතික යටිතල පහසුකම් ඇතිකිරීම / නවීකරණය කිරීම හා ඒවාට අදාල සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම /වැඩිදියුණු කිරීම.

**1.5** ප්‍රාථමික හා ද්විතික පාසල්වල භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම / භාණ්ඩ සැපයීම, ඒවාට අදාල ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම.

**1.6** ප්‍රාදේශීය රෝහල්, ග්‍රාමීය බෙහෙත් ශාලා (dispensary), සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල, රජයේ ආයුර්වේද රෝහල් සහ මාතෘ හා ළමා සායනයන්හි භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම / භාණ්ඩ සැපයීම, ඒවාට අදාල ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම.

**1.7** ග්‍රාමීය ක්‍රීඩා පිටි සහ පුස්තකාල සඳහා පහසුකම් ඇතිකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති.

**1.8** සුළු වාරිමාර්ග යටතේ කුඩා වැව්, ඇලවේලි, අමුණු, ජලබස්නා ස්ථාන සහ ජල පොකුණු, වගා ළිං, නළ ළිං ඉදි කිරීම සහ ප්‍රතිසංස්කරණය.

**1.9** ලියාපදිංචි සමිති / ප්‍රජාමුල සංවිධාන, ප්‍රජා ශාලා, පෙර පාසල්, ළමා නිවාස සහ වැඩිහිටි නිවාස සඳහා උපකරණ සැපයීම.

**1.10** ලියාපදිංචි දහම් පාසල්, ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා පහසුකම් සම්පාදනය/ උපකරණ සැපයීම සහ සුසාන භූමි ප්‍රතිසංස්කරණය කිරීම.

**1.11** විවිධ වැඩසටහන් යටතේ වැඩ ආරම්භකර මේ වන විට අර්ධ වශයෙන් වැඩ නිමකර දීර්ඝ කාලයක් තිස්සේ අතහැර දමා ඇති ආර්ථිකමය වශයෙන් ප්‍රජාවට ප්‍රතිලාභ හිමිවන, 2022 වර්ෂය තුලදී වැඩ අවසන් කර භාවිතයට ගත හැකි කුඩා ප්‍රමාණයේ ගොඩනැගිලි සම්පූර්ණ කිරීම.

**1.12** වන සතුන්ගෙන් ජනාවාසවලට එල්ලවන උවදුරු දුරු කිරීම හෝ අවම කිරීම සඳහා වන යෝජනා.

**1.13** සනීපාරක්ෂක පහසුකම් නොමැති නිවාස සඳහා වැසිකිළි පහසුකම් ඇතිකිරීම, නිවාස සඳහා විදුලිය පහසුකම් ලබා ගැනීම සඳහා නිවස වයරින් කිරීමට පහසුකම් ලබාදීම හා පානීය ජල සම්බන්ධතා ලබා දීම.

**2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ප්‍රතිපාදන බෙදීයන ආකාරය**

**2.1** එක් මන්ත්‍රීවරයකුගේ සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් සියයට 50 (රුපියල් මිලියන 7.5 ක්) ක අවමයක් භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්) සඳහා වෙන් කළ යුතුය.

**2.2** එක් ව්‍යාපෘතියක උපරිම වටිනාකම රු. මිලියන 5 කට සීමා විය යුතුය.

**2.3** ප්‍රතිපාදනයෙන් සියයට 20 ක (රුපියල් මිලියන 3 ක්) උපරිමයක් දක්වා වටිනාකම රුපියල් 200,000/- ට අඩු ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැක.

**2.4** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර ජනගහනය, දරිද්‍රතාවය සහ භූමි ප්‍රමාණය යන සාධක පදනම් කර ගෙන ප්‍රතිපාදන බෙදී යන පරිදි ව්‍යාපෘති යොජනා ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

**2.5** මෙම ප්‍රතිපාදන යටතේ පොදු කාර්යයන් සඳහා පමණක් ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු අතර උක්ත හා 1.13 යටතේ තෝරාගන්නා ව්‍යාපෘති හැර එක් එක් පුද්ගලයන්ට හෝ පෞද්ගලික කටයුතු සඳහා ඍජු ප්‍රදාන ලබා නොදිය යුතුය.

**2.6** උක්ත 1.13 යටතේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් පරික්ෂා කිරීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන උපදෙස් අනුගමනය කළ යුතුය.

**ප්‍රතිලාභීන්ගේ සුදුසුකම්**

I. ප්‍රතිලාභීන් තෝරාගැනීමේ දී ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී, දරිද්‍රතාවයෙන් පෙළෙන ස්වඋත්සාහයෙන් උක්ත පහසුකම් සලසාගත නොහැකි පවුල් වෙත ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

II. අබාධිත පුද්ගලයින්/විශේෂ අවශ්‍යතා ඇති දරුවන්/වැඩිහිටි පුද්ගලයින් සිටින පවුල සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

**ප්‍රතිපාදන සීමාව**

| සංවර්ධන අංශය | එක් ප්‍රතිලාභියකුට උපරිම ප්‍රතිපාදනය |
|---|---|
| වැසිකිළි පහසුකම් ඇතිකිරීම - නිවාස | රුපියල් 50,000.00 |
| නිවස වයරින් කිරීමට | රුපියල් 25,000.00 |
| පානීය ජල සම්බන්ධතා ලබා දීම | රුපියල් 20,000.00 |

III. තොරාගන්නා ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්දේශය සුදුසු ක්ෂේත්‍ර නිළධාරි/නිළධාරීන් මගින් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකර **ඇමුණුම 01** අනුව ප්‍රාදේශීය ලේකම් මගින් ලබාගත යුතුය.

IV. නාගරික හා වතුකරය ආශ්‍රිත සමූහ ජනාවාස වෙත පොදු වැසිකිළි පහසුකම් ඇතිකිරීම සඳහා එක් වැසිකිළි ඒකකයකට රුපියල් 500,000.00 ක ප්‍රතිපාදන වෙන් කළ හැක.

## 3. ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රමවේදය

3.1 සියළුම ව්‍යාපාති යෝජනා ඔබ වෙත ලැබුණු පසු සති 2 ක් ඇතුලත අදාල ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර අදාල ව්‍යාපෘති යෝජනා 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කල හැකි බවට නිර්දේශයක් ලබා ගත යුතුය.

3.2 ඉදිකිරීම් වැඩ සඳහා **ඇමුණුම 2** හි දැක්වෙන පරිදි ප්‍රාදේශීය ලේකම් මගින් ශක්‍යතා වාර්තාවක් ලබා ගත යුතුය.

3.3 ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමට පෙර එම ඉදිකිරීම යෝජිත අරමුණ සඳහා අනාගතයේදී බාධාවකින් තොරව යොදා ගත හැකි බව හා නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් සහතික විය යුතුය.

3.4 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ක්‍රියාත්මක කළ හැකි සියළුම ව්‍යාපෘති යෝජනා ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3.5 2022 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ඔබගේ දිස්ත්‍රික්කයට අදාළව දිස්ත්‍රික් මන්ත්‍රීවරුන්ගෙන් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු විසින් මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූල ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා **2022 පෙබරවාරි 28 දිනට පෙර ඔබ විසින් අනුමත කර** ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ට යොමුකළ යුතුය.

3.6 2022 වර්ෂය සඳහා වන විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වන ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ වෙනම අයිතමයක් ලෙස ඇස්තමේන්තු වල පෙන්නුම් කර ඇත.

3.7 යාපනය හා වන්නි මැතිවරණ දිස්ත්‍රික්කවල ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන විමධ්‍යගත ප්‍රතිපාදන යාපනය, කිලිනොච්චි, වවුනියාව, මන්නාරම හා මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු මගින් වෙන්කර දී ඇත.

3.8 ඉහත 3.6 හි සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක සහ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් යම් විමසීමක් වෙතොත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා එය තහවුරු කර ගත යුතුය.

3.9 විමධ්‍යගත අයවැය වැඩසටහනට අදාළව ඉදිරිපත් වන ව්‍යාපෘති ඇගයීම හා අනුමත කිරීම, ප්‍රගතිය නිරීක්ෂණය හා පසුවිපරම සඳහා ඔබගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතුය.

3.10 සියළුම ව්‍යාපෘති රජයේ අනුමත නිතිරීති, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය.

3.11 2022 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන සියළුම ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය.

3.12 මෙම වැඩසටහන යටතේ 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් හඳුනාගත යුතුය. සියළුම ව්‍යාපෘති 2022 දී අවසන් කර සියළුම මුදල් ගෙවීම් සම්පූර්ණ කරන බවට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සහතික විය යුතුය. 2022 වර්ෂයෙන් ඉදිරියට ව්‍යාපෘති අවිච්ඡේද කිරීම නොකළ යුතුය.

## 4. පරිපාලන පිරිවැය

4.1 මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක වන ඉදිකිරීම් හා ඉදිකිරීම් නොවන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් ගේ මුළු ව්‍යාපෘති වටිනාකමින් සත්‍ය වශයෙන් වියදම් කල මුදලින් **සියයට 3** ක වටිනාකමක් පරිපාලන පිරිවැය වෙනුවෙන් වෙන් කල යුතුය. සංවර්ධන වැඩසටහන් සඳහා ඇස්තමේන්තු සකස් කිරිමේදී අදාල පරිපාලන පිරිවැය ද ඊට ඇතුලත් කල යුතු බව දන්වමි.

මෙසේ වෙන්වන පරිපාලන පිරිවැය පහත පරිදි වෙන්කර දිය යුතුය.

| | |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත | **1%** |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත | **2%** |

4.2 ප්‍රදේශීය ලේකම් කාර්යාලය සෘජුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර වෙනත් අදාළ රාජ්‍ය ආයතනයක් (උදා: පළාත් පාලන ආයතන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි) මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වෙන් කරනු ලබන **සියයට 2** ක පරිපාලන පිරිවැය පහත පරිදි බෙදා වෙන්කළ යුතුය

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත | **1%** |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයට | **1%** |

4.3 වෙන් කරනු ලබන පරිපාලන පිරිවැය අදාළ රැස්වීම් සංවිධානය, සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙ කාර්යය හා අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරිම වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් සම්බන්ධ රාජකාරි ඉටු කරන දිස්ත්‍රික් මට්ටමෙ නිලධාරින් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරින් සඳහා ගමන් වියදම්, සංයුක්ත දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමටත් අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනිම සඳහාත් භාවිතා කළ හැකිය.

## ප්‍රගතිය අධීක්ෂණය කිරිම, විගණනය හා වෙනත් කරුණු

## 5. ප්‍රගතිය අධීක්ෂණය

5.1 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති, **ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව** මගින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

5.2 ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල **භෞතික හා මූල්‍ය ප්‍රගතිය මාසිකව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව** වෙත වාර්ථා කරනු ඇත.

## 6. විගණනය

6.1 විමධ්‍යගත අයවැය අරමුදල් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙ ක්‍රමවේදයේ විනිවිදභාවය හා ක්‍රියාත්මක ව්‍යාපෘතින්ගේ ගුණාත්මකභාවය සහතික කිරිම සඳහා සමස්ත වැඩසටහන මනාව විගණනය වන ආකාරයේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

7. වෙනත් කරුණු

7.1 විමධ්‍යගත අයවැය වැඩසටහන 2022 ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික පියවරයන් ට අදාල කාලරාමුව මේ සමග අමුණා ඇත. **(ඇමුණුම 03)**

7.2 විමධ්‍යගත අයවැය වැඩසටහන 2022 මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම බදු හා වෙනත් ගෙවීම් මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන මගින් ආවරණය කරගත යුතු අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන හිමි නොවනු ඇත.

7.3 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා විසින් ලබාදෙන යෝජනා **ඇමුණුම** අංක **04** ආකෘතිය මගින් සකස් කල යුතුය.

7.4 අනුමැතිය ලබාගත් දිස්ත්‍රික්කයේ සමස්ත ව්‍යාපෘති යෝජනා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව හා (2022 වර්ෂයේ සියලුම වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනුයේ කාර්තුමය පදනම මත බැවින්) ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට අදාළ කාලය නිවැරදිව තීරණය කර කාර්තු අනුව ප්‍රතිපාදන අවශ්‍යතාව **2022 මාර්තු මස 01** වන දිනට **පෙර ඇමුණුම 5** අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව **ජාතික අයවැය දෙපාර්තමේන්තුව** වෙත යොමු කළ යුතුය.

7.5 ඔබගේ දිස්ත්‍රික්කය වෙත ඉදිරිපත්වන අනුමත ව්‍යාපෘති යෝජනාවල සාරාංශය **ඇමුණුම 6** මගින් **2022 මාර්තු මස 01**වන දිනට පෙර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

7.6 සමස්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මෙම චක්‍රලේඛයේ උපදෙස්වලට මුලුමනින්ම අනුගත වන බවට ඔබ විසින් සහතික විය යුතුය.

එසේම මෙම චක්‍රලේඛයේ අන්තර්ගතය පිළිබඳ ඔබගේ දිස්ත්‍රික්කයේ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් කඩිනමින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

**එස්.ආර්.ආටිගල**
**ලේකම්**

පිටපත් -

1. සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා - කාරුණික දැන ගැනීම පිණිස හා හඳුනාගත් ව්‍යාපෘති යෝජනා - අදාල දිස්ත්‍රික්ලේකම් / දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත **2022 ජනවාරි මස 31** වන දිනට පෙර යොමු කිරීමට
2. ලේකම් - ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
3. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
4. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
9. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරු
10. සියලුම දිස්ත්‍රික් ප්‍රධාන ගණකාධිකාරිවරු

# ප්‍රතිලාභී සුදුසුකම් වාර්තාව - 2022

01. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය : ..........................................................................

02. ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය : ..........................................................................

03. ප්‍රතිලාභියාගේ/සමූහ ජනාවාසයේ නම : ..........................................................................

04. ප්‍රතිලාභියාගේ/ සමූහ ජනාවාසයේ ලිපිනය : ..........................................................................

05. යෝජිත ව්‍යාපෘතියේ නම : ..........................................................................

06. මෙම වැඩසටහන යටතේ වෙන් කිරීමට යෝජිත ප්‍රතිපාදන මුදල (රු). : ..........................................

07. ව්‍යාපෘතියේ ස්වභාවය (√) යොදන්න:

| | |
|---|---|
| I. සම්පූර්ණයෙන්ම නව ඉදිකිරීමකි | |
| II. ආරම්භ කර ඇති ව්‍යාපෘතියක ඉතිරි කොටස සංවර්ධනය කිරීම | |
| III. විදුලි පහසුකම් ඇතිකිරීම | |
| IV. නිවාස සඳහා පානීය ජල සම්බන්ධතා ලබාදීම | |

08. ඉහත අනු අංක 5. යටතේ හඳුනාගත් ව්‍යාපෘතිය පිළිබඳ පහත තොරතුරු සපයන්න

8.1 ප්‍රතිලාභියා ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත

8.2 ප්‍රතිලාභියා ලබාදී ඇති ලිපිනයට අදාළ ඉඩමේ හිමිකරුවාද? ඔව්/නැත

8.3 ප්‍රතිලාභියා දෙමාපියන්ට හිමි ඉඩමක පදිංචිකරුවෙක්ද? ඔව්/නැත

8.4 ප්‍රතිලාභියා ලබාදී ඇති ලිපිනයේ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත

8.5 ප්‍රතිලාභියා ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පුද්ගලයෙකුද? ඔව්/නැත

8.6 ප්‍රතිලාභී පවුලේ සාමාජිකයින් ලෙස අබාධිත පුද්ගලයින් සිටීද? ඔව්/නැත

8.7 ප්‍රතිලාභී පවුලේ සාමාජිකයින් ලෙස විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටීද? ඔව්/නැත

8.8.ප්‍රතිලාභියා වැඩිහිටි පුද්ගලයෙකුද? ඔව්/නැත

8.9 ව්‍යාපෘතිය සමූහ ජනාවාසයකට අයත් සංවර්ධනයක්ද? ඔව්/නැත

8.10 යෝජිත ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - ☐

නිවාස සඳහා විදුලි / පානීය ජල පහසුකම් ඇතිකිරීමේ ව්‍යාපෘති සඳහා පමණක් අදාළව,

8.11 ප්‍රතිලාභී නිවසේ දැනට ස්ථිර විදුලි/ ස්ථිර පානීය ජල පහසුකම් තිබේද? ඔව්/නැත

8.12 නොමැතිනම්, දැනට සනීපාරක්ෂක / පානීය ජල පහසුකම් සලසා ගන්නා ආකාරය ....................

..........................................................................................................................

09. 2022 මුදල් ආයෝජන පිළිබඳ විස්තර

9.1 මෙම ප්‍රතිලාභියා වෙත යෝජිත කාර්යයන් සඳහා මෙම වසරේ වෙනත් මූලාශ්‍රයකින් මුදල් වෙන් වී හෝ වෙන් කිරීමට නියමිතව තිබේද? ඔව්/ නැත

9.2. ඉහත 9.1 යටතේ ඔව් නම් පහත තොරතුරු සපයන්න

| මූලාශ්‍රය | අමාත්‍යාංශය/ ආයතනය | ආවරණය වන වැඩ කොටස | මුදල (රු.) | එමගින් ව්‍යාපෘතිය සම්පූර්ණ කල හැකිද? |
|---|---|---|---|---|
| 1. | | | | ඔව්/නැත |
| 2. | | | | ඔව්/නැත |

9.3 යෝජිත ව්‍යාපෘතිය නිම කිරීමට යෝජනා කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ. / ප්‍රමාණවත් නොවේ.

9.4 මෙම ආයෝජන මඟින් ව්‍යාපෘතිය

i. සම්පූර්ණයෙන් නිම වේ /කොටසක් සම්පූර්ණ වේ / තවදුරටත් ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට රු.________________ ක ප්‍රතිපාදන (දළ වශයෙන්) යෙදවිය යුතුය.

9.5 සංවර්ධනය කිරීමට යෝජිත පහසුකම් දැනට හොඳ මට්ටමක පවතීද? ඔව්/නැත

ඒ අනුව, යෝජිත ප්‍රතිපාදනය වෙන් කළ යුතු **නොවේ / කල යුතු වේ.**

9.6 ප්‍රතිලාභියා විසින් ශ්‍රමදායකත්වය හා ද්‍රව්‍යාධාර ලබාදෙන්නේනම් දළ වශයෙන් එහි වටිනාකම ....................................................

10. 2022 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය නිම කළ හැකිද? හැකිය/නොහැකිය

10.1 ඔව් නම් ඒ සඳහා ගත විය හැකි කාලය: - ............ සිට ............. දක්වා මාස / සති ............

11. මෙම ව්‍යාපෘතිය පිළිබඳව ග්‍රාම නිළධාරිගේ හා සංවර්ධන නිළධාරි / සංවර්ධන සහකාරගේ නිර්දේශය

| | |
|---|---|
| ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකරන ලදී / සිදු නොකරන ලදී | ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකරන ලදී / සිදු නොකරන ලදී |
| ඉහත තොරතුරු සත්‍ය බවට හා යෝජිත පහසුකම ලබා දීම සුදුසු බව යෝජනා කරමි/නොකරමි. | ඉහත තොරතුරු සත්‍ය බවට හා යෝජිත පහසුකම ලබා දීම සුදුසු බව යෝජනා කරමි/නොකරමි. |
| ............................<br>ග්‍රාම නිළධාරි<br>ග්‍රාම නිළධාරි වසම (නම හා අංකය)<br>දිනය:- | ............................<br>සංවර්ධන නිළධාරි / සංවර්ධන සහකාර<br>ග්‍රාම නිළධාරි වසම (නම හා අංකය)<br>දිනය:- |

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා යෝජිත පහසුකම 2022 වර්ෂයේ දී ලබා දීම සුදුසු බවට / නුසුදුසු බවට නිර්දේශ කරමි.

................................... දිනය:-

නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

(මුද්‍රාව)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා යෝජිත පහසුකම 2022 වර්ෂයේ දී ලබා දීම සුදුසු බවට / නුසුදුසු බවට සහතික කරමි.

......................... දිනය:-

ප්‍රාදේශීය ලේකම්

(මුද්‍රාව)

## යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘති මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව - 2022

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
02. ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය :
03. යෝජිත ව්‍යාපෘතියේ නම :
04. මෙම වැඩසටහන යටතේ වෙන් කිරීමට යෝජිත ප්‍රතිපාදන මුදල (රු). :
05. ව්‍යාපෘතියේ ස්වභාවය (√) යොදන්න:

   I. සම්පූර්ණයෙන්ම නව ඉදිකිරීමකි ☐
   II. නව ඉදිකිරීමකි (එක් කොටසක් වශයෙන්/එක් අදියරක් වශයෙන්) ☐
   III. පවතින ව්‍යාපෘතියක කොටසකි ☐
   IV. පවතින ව්‍යාපෘතියක අළුත්වැඩියාවකි / ප්‍රතිසංස්කරණයකි ☐

6. ඉහත අනු අංක 5. යටතේ හඳුනාගත් ව්‍යාපෘතිය පිළිබඳ පහත තොරතුරු සපයන්න

6.1. ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩම රජයට අයත්ද? ඔව්/නැත
නැති නම් රජයට පවරා දීමට යෝජිත ඉඩම නිරවුල් ද? ඔව්/නැත

ඉඩම නිරවුල් නම්, ඒ සඳහා අදාළ ඉඩමේ හිමිකාරීත්වය විසින් ලිඛිතව
එකඟතාවය ලබා දී තිබේ / එකඟතාවය ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත ඔව්/නැත

6.2. අදාළ ඉදිකිරීම සිදුකිරීමට විශේෂයෙන් පහත ආයතනයකින් හෝ ආයතන කිහිපයකින් එකඟතාවය ලබාගැනීම අවශ්‍ය නම්, ඒ බව සඳහන් කරන්න

| අනු. අංකය | ආයතනය | එකඟතාවය ලබාගත යුතු ද නැද්ද යන වග | අදාළ ආයතනයෙන් එකඟතාවය ලබාගත හැකිවේද? |
|---|---|---|---|
| 1 | මධ්‍යම පරිසර අධිකාරිය | ඔව්/නැත | ඔව්/නැත |
| 2 | භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | ඔව්/නැත | ඔව්/නැත |
| 3 | වන සංරක්ෂණ දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 4 | වන ජීවී දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 5 | පළාත් පාලන ආයතනය ( සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |
| 6 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ඔව්/නැත | ඔව්/නැත |
| 7 | විදුලිබල මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 8 | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 9 | වෙනත් | ඔව්/නැත | ඔව්/නැත |

7. පසුගිය වර්ෂවල සිදුකළ ආයෝජනයන් පිලිබඳ විස්තර

7.1. ආසන්න වර්ෂ 03 තුළ මෙම ව්‍යාපෘතියේ යෝජිත කාර්යයන් සඳහා
කිසියම් ආයතනයක් මුදල් ආයෝජනය කර තිබේද? ඔව්/නැත

ඔව් නම්, පහත සඳහන් ආකෘතිය සම්පූර්ණ කරන්න

| වර්ෂය | මුදල (රු.) | ආයෝජනය කළ ආයතනය | විශේෂ කරුණු (ඇත්නම්) |
|---|---|---|---|
| 2021 | | | |
| 2020 | | | |
| 2019 | | | |

7.2. එසේ නම් ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කර තිබේද? ඔව්/ නැත

**8. 2022 මුදල් ආයෝජන පිළිබඳ විස්තර**

8.1 මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ වෙනත් මූලාශ්‍රයකින් මුදල් වෙන් වී හෝ
වෙන් කිරීමට නියමිතව තිබේද? ඔව්/ නැත

8.2. ඉහත 8.1 යටතේ ඔව් නම් පහත තොරතුරු සපයන්න

| මූලාශ්‍රය | අමාත්‍යාංශය/ ආයතනය | ආවරණය වන වැඩ කොටස | මුදල (රු.) | එමගින් ව්‍යාපෘතිය සම්පූර්ණ කල හැකිද? |
|---|---|---|---|---|
| 1. | | | | ඔව්/නැත |
| 2. | | | | ඔව්/නැත |

8.3. යෝජිත ව්‍යාපෘතිය නිම කිරීමට යෝජනා කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ. / ප්‍රමාණවත් නොවේ.

8.4. මෙම ආයෝජන මගින් ව්‍යාපෘතිය

i. සම්පූර්ණයෙන් නිම වේ /කොටසක් සම්පූර්ණ වේ / තවදුරටත් ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට රු.________________ ක ප්‍රතිපාදන (දළ වශයෙන්) යෙදවිය යුතුය.

8.5. සංවර්ධනය කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය දැනට හොඳ මට්ටමක පවතිද? ඔව්/නැත
ඒ අනුව, යෝජිත ප්‍රතිපාදනය වෙන් කළ යුතු නොවේ / කල යුතු වේ.

09. යෝජිත ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන නිමවුම / ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ විස්තර

i. **මාර්ග ව්‍යාපෘතියක් නම්** අලුතින් වැඩි දියුණු කරන / අලුතින් ඉදි කෙරෙන දුර ප්‍රමාණය - (මීටර්/ කි.මී).................

ii. **කෘෂිකර්ම / වාරිමාර්ග ව්‍යාපෘතියක් නම්** දුර (මී/කි.මී)....... අලුතින් අස්වැද්දෙන බිම ප්‍ර. (අක්).....

iii. වෙනත්: ………………………………………………………………………………

iv. ප්‍රතිලාභීන් සංඛ්‍යාව - පවුල්:--------- පුද්ගල - (ස්ත්‍රී):- --------- (පුරුෂ):- ---------

10. ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රජාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභ සඳහන් කරන්න
i.
ii.
iii.

11. ප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රජා අවශ්‍යතා අතර මෙම ව්‍යාපෘතිය, අත්‍යාවශ්‍යයි/ අවශ්‍යයි/ ප්‍රමුඛ නැත/ අවශ්‍ය නැත

12. 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය නිම කළ හැකිද? හැකිය/නොහැකිය

13. ඔව් නම් ඒ සඳහා ගත විය හැකි කාලය: - ............. සිට .................. දක්වා මාස / සති ................................

14. ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු

14.1. නිමවූ පසු නඩත්තුව බාරවන ආයතනය - ......................................... ........................................ ...........

14.2 නිමවූ පසු නඩත්තු වැඩ පිළිවෙලක් තිබේද ? විස්තර දක්වන්න - ........................................ ...................
...................................... ...................... ................................ ................... ...........................

15. මෙම ව්‍යාපෘතිය පිළිබඳව ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකරන ලදී / සිදු නොකරන ලදී.

ඉහත තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

............................ දිනය:-
සංවර්ධන නිලධාරී / සංවර්ධන සහකාර
ග්‍රාම නිලධාරී වසම (නම හා අංකය)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට නිර්දේශ කරමි.

................................. දිනය:-
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
(මුද්‍රාව)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට සහතික කරමි.

........................ දිනය:-
ප්‍රාදේශීය ලේකම්
(මුද්‍රාව)

ඇමුණුම 03

විමධ්‍යගත අයවැය වැඩසටහන 2022 - ක්‍රියාකාරී සැලැස්ම

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | වගකීම |
|---|---|---|---|
| 01 | ගරු මන්ත්‍රිවරුන්ගේ ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත යොමුකිරීම | **2022** ජනවාරි මස **31** වන දිනට පෙර | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් |
| 02 | අදාල ව්‍යාපෘති යෝජනා 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කල හැකි බවට සහතික වීම | ගරු මන්ත්‍රිවරුන්ගේ ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත ලැබී සති 2 ක් තුල | දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>ප්‍රාදේශීය ලේකම්.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 03 | ප්‍රදේශීය සංවර්ධන කමිටුවේ අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කිරීම. | **2022** පෙබරවාරි **28** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ,<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 04 | ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්වල මාසික භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම | මාසික ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකිරීම | අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

ඇමුණුම 04

විමධ්‍යගත අයවැය වැඩසටහන - 2022

දිස්ත්‍රික්කය-

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ නම -

| | | | ඉදිකිරීම් ව්‍යාපෘති වටිනාකම 50% (අවමය රු.මිලියන 7.5 ) | | | මිලදී ගැනීම් හා පුහුණු 50% (උපරිමය රු මි. 7.5) | 3 + 4 (උපරිමය රු.මි. 15.0) |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | |
| අ.අංකය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘතියේ නම | රු.. 200,000/- ට අඩු (උපරිමය රු . 3,000,000.00 දක්වා) | රු. 200,000/- ට වැඩි | ඉදි කිරීම් වල එකතුව (1 + 2) | සමාජ, ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනය ඉලක්ක කර ගත් පහසුකම් සැපයීම (මිලදී ගැනීම) | |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |
| 6 | | | | | | | |
| 7 | | | | | | | |
| 8 | | | | | | | |
| 9 | | | | | | | |
| 10 | | | | | | | |
| එකතුව | | | - | - | - | - | - |
| | | | උපරිමය රු. මි 3,000,000.00 | | අවමය රු.මි 7.500,000.00 | උපරිමය රු.මි. 7,500,000.00 | උපරිමය රු.මි. 15,000,000.00 |

ඇමුණුම 5

**විමධ්‍යගත අයවැය වැඩසටහන 2022**

කාර්තුමය මූල්‍ය හා භෞතික ඉලක්ක

දිස්ත්‍රික්කය :……………………………………

| ප්‍රධාන ක්‍රියාකාරකම | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | මුලු ඇස්තමේන්තුගත පිරිවැය රු. (මිලියන) | මූල්‍ය ඉලක්ක 2022 (රු. මිලියන) | | | | 2022 සඳහා භෞතික ඉලක්ක % | | | | ප්‍රතිලාභී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කාර්තු 1 | කාර්තු 2 | කාර්තු 3 | කාර්තු 4 | කාර්තු 1 | කාර්තු 2 | කාර්තු 3 | කාර්තු 4 | |
| විමධ්‍යගත අයවැය | | | | | | | | | | | |

පරීක්ෂා කළේ

සහතික කළේ

සකස් කළේ : ……………………………

දිනය : ……………………………

……………………………
දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ

……………………………
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

……………………………
දිස්ත්‍රික් ලේකම්

මුද්‍රාව

මුද්‍රාව

මුද්‍රාව

ඇමුණුම 06

විමධ්‍යගත අයවැය වැඩසටහන - 2022

එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වෙත වෙන්වන ප්‍රතිපාදන බෙදී යන ආකාරය

දිස්ත්‍රික්කය-

| | | | ඉදිකිරීම් ව්‍යාපෘති වටිනාකම 50% (අවම රු.මිලියන 7.5 ) | | | මිලදී ගැනීම් හා පුහුණු 50% (උපරිමය රු. මි. 7.5) | |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | |
| අංකය | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ නම | දිස්ත්‍රික්/ ජාතික ලයිස්තු | රු.. 200,000/- ට අඩු (උපරිමය රු . 3,000,000.00 දක්වා) | රු. 200,000/- ට වැඩි | ඉදි කිරීම් වල එකතුව (1 + 2) | සමාජ, ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනය ඉලක්ක කර ගත් පහසුකම් සැපයීම(මිලදී ගැනීම්) | මුළු එකතුව 3 + 4 (උපරිමය රු.මි. 15.0) |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| එකතුව | | | - | - | - | - | - |
| | | | උපරිමය රු. මි 3,000,000.00 | | අවමය රු.මි 7.500,000.00 | උපරිමය රු. මි. 7.500,000.00 | උපරිමය රු.මි. 15,000,000.00 |

පරික්ෂා කලේ

සහතික කලේ

සකස් කලේ : ................................

දිනය : ..................................

.................................

දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මුද්‍රාව

.................................

දිස්ත්‍රික් ලේකම්

මුද්‍රාව